## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව - 2014

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සහ එහි පරිපාලිත සමාගමක් වන සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ 2014 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.1 හා 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාචනය - සමූහය

මෙම වාර්තාවේ 2.2.1 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සහ එහි පරිපාලිත සමාගමක් වන සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

#### මතය ව්‍යාචනය - සංස්ථාව

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1.1.මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින් සියයට 62.45 ක් හිමිව ඇති බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණු නමුත් සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

**2.2.1.2 සමූහයේ අඛණ්ඩ පැවැත්ම**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ප්‍රාග්ධනය රු.මිලියන 967 ක් වූ අතර සමුච්චිත අලාභය රු.මිලියන 81 ක් විය. සංස්ථාවේ පැවැත්මට බලපෑමක් වී නැතත්, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම දිගින් දිගටම අලාභ ලබා තිබීම හේතුවෙන් ඒකාබද්ධ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය අනුව රු.මිලියන 2,423 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණු අතර ප්‍රාග්ධනය රු.මිලියන 2,702 ක් විය.ඒ අනුව කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 89.7 ක්ම ඛාදනය වී ඇති බව නිරීක්ෂණය වූ අතර සීමාසහිත ලංකා සිමෙන්ති සමාගම සමඟ ඒකාබද්ධ ගිණුම් පරීක්ෂා කිරීමේදී දිගින් දිගට පවත්වාගෙන යාම පිළිබඳ අවිනිශ්චිතභාවයක් ඇති වී ඇති බව නිරීක්ෂණය විය.

**2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 13 ට අනුකූලව ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින්, සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ආයෝජනය කර ඇති රු. 10 කොටස් 108,361,891 ක අගය වර්තමාන වෙළඳපල අගයට ගලපා නොතිබුණි.

**2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

සංස්ථාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ හුණුගල් නිධිය කුලියට දීමෙන් ලැබෙන ආදායම වන අතර එම හුණුගල් නිධිය පිහිටි අරුවක්කාළු අක්කර 5,352 ක ඉඩම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් තුනකට අදාල ශේෂ අදාල ලෙජර් ගිණුම් සමග සැසඳීමේදී එකතුව රු. 322,422 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන කාර්යාලයේ ලෙජරයේ ඇති යාපනය ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂය හා යාපනය ශාඛා ලෙජරයේ ඇති ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමේ ශේෂය අතර රු. 57,780 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) පාලන ගිණුම් හතරකට අදාල ශේෂ ඒවාට අදාල උපලේඛන සමඟ සැසඳීමේදී එකතුව රු. 39,838,480ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෙළඳ බැරකම් ශේෂය රු.68,515,720 ක් වූ අතර එයින් රු.12,000,014 ක් වසර 2-3 ක්ද, රු.38,453,542 ක් වසර 03ක් හා ඊට වැඩි පැරණි ණය ශේෂ වූ අතර එම ණය ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂය රු.94,932,379 ක් වූ අතර එයින් රු.4,920,058 ක් වසර 1 - 2 ක්ද, රු.5,141,093 ක් වසර 2 - 3 ක්ද, රු.47,927,159 ක් වසර 03 ක් හා ඊට වැඩි පැරණි ණය ශේෂ විය. එකතුව රු.14,134,819 ක් වූ ණය ශේෂ සඳහා වයස් විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු. 22,081,299 ක් වූ ස්ථාවර වත්කම් සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තාද, එකතුව රු. 14,134,819 ක් වූ ණයගැතියන් සඳහා ශේෂ සනාථ කිරීමේ ලිපි හා කාල විශ්ලේෂණයන්ද , වටිනාකම රු. 5,463,825 ක් වූ අවසන් තොග සඳහා තොග සමීක්ෂණ මණ්ඩල වාර්තාද විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු රු.13,358,852 ක් වූ එකතු කළ අගය මත වූ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණු අතර,එකතුව රු.4,282,739 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවිය යුතු බදු වලින් හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 2 වගන්තිය | දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළයුතු රු.5,002,459 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 | මුදල් වර්ෂය අවසන් වූ වහාම වත්කම් පිළිබඳව සමීක්ෂණයක් පවත්වා වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 1990 අංක 6 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තියේ 3 වගන්තිය | බස්නාහිර පළාත් ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කළ යුතු ඉකුත් වර්ෂවලට අදාළ රු.7,101,932 ක් වූ ව්‍යාපාර පිරිවැටුම් බදු මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. |

(ඉ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 4.2.2 වගන්තිය | සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය සහ කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) 8.3.8 වගන්තිය | අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව හා සංස්ථාවේ දුර්වල මූල්‍ය තත්ත්වය නොසලකා සමාලෝචිත වර්ෂය තුළ දී රු.54,121 ක පරිත්‍යාග හා ආධාර ලබා දී තිබුණි. |
| (ඊ) 2005 ජනවාරි 21 දිනැති අංක පීඊඩී 28 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | කුලී පදනම මත වාහන ලබා ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂක ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත් සංස්ථාව විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබිණි. |
| (උ) 1978 දෙසැම්බර් 10 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙනගොස් නොතිබුණි. |
| (ඌ) 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | වර්ෂය තුල අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති රාජ්‍ය සංස්ථා විසින් ගෙවිය හැකි ප්‍රසාද දීමනාව රු. 5,000 ක් වුවත්, සේවකයන් 27 දෙනෙකු වෙනුවෙන් රු.13,500 බැගින් රු. 364,500 ක මුදලක් වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. ඒ අනුව රු. 229,500 ක් ප්‍රසාද දීමනා වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව, සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වලින් සංස්ථාව රු.14,490,896 ක ඌනතාවයක් ලබා තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 424,686,915 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.410,196,019 කින් අඩු වී ඇත. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් රු. 418,821,486 කින් අඩුවීම මෙම ඌනතාවය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්තමානයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සහ සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ප්‍රධාන කාර්යය වී ඇත්තේ සිමෙන්ති ආනයනය කර, දේශීය වෙළඳපලේ අළෙවි කිරීම බැවින් ආයතන දෙකම එකම කාර්යයක් කරන බව නිරීක්ෂණය විය. 2011 අගෝස්තු 16 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී මෙම ආයතන දෙක ඒකාබද්ධ කළයුතු බවට තීරණය කර තිබුණත් එය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කන්කසන්තුරේ සිමෙන්ති කොන්ක්‍රීට් නිෂ්පාදන සහ අලෙවි අංශය 2007 වර්ෂයේ සිට 2014 දක්වාම අලාභ ලබා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අලාභය රු.18,765,596 ක් විය.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

ණය පදනම මත සිමෙන්ති විකිණීම සඳහා අළෙවි නියෝජිත ධූරය ප්‍රදානය කිරීමේ දී ණයට ලබාදෙන වටිනාකමට සරිලන ඇප බැඳුම්කරයක් ලබා නොගැනීම, ණය විය හැකි උපරිම ප්‍රමාණයන් ගිවිසුමේ සඳහන් නොකිරීම, ණය ගෙවීම පැහැර හරින්නන්ගෙන් ණය අයකර ගන්නා ක්‍රමවේදය ගිවිසුමට ඇතුළත් නොකිරීම, ණය ගෙවීමට අපොහොසත්ව තිබියදී නැවත නැවතත් ණයට සැපයීම, බැංකු ඇපකර සඳහා ව්‍යාජ තොරතුරු ලබාදීම, අවිධිමත් පරිදි ණය අනුමත කරන ලද නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග නොගැනීම හා අයවිය යුතු ණය ශේෂ පිළිබඳ පසු විපරම් නොකිරීම වැනි කළමනාකරණ අකාර්යක්ෂමතා හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු.66,249,030 ක ණය ශේෂයක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.

**4.3 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් එකතුව රු.671,843,724 ක් සීමාසහිත ලංකා සිමෙන්ති සමාගමේ ආයෝජනය කර වසර 16 කට අධික කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාවට ලැබී නොතිබිණි.

(ආ) සංස්ථාව විසින් පෞද්ගලික සමාගමක ආයෝජනය කර තිබූ රු.6,400,000 ක් වූ මුදල සඳහා 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාම කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(ඇ) අන්තර් ජාතික සමාගමකට වන්දි ගෙවීම සඳහා ලබා ගත් බැංකු ණය වෙනුවෙන් රු.3,497,634 ක් පොලී ලෙස ගෙවීමට සිදු වී තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි අක්කර 752 ක් වූ ඉඩම් සහ කර්මාන්ත ශාලාව සහිත ගොඩනැගිලි සංකීර්ණය සහ මන්නාරම මුරුන්කන් හි පිහිටි අක්කර 211 ක ඉඩම අධි ආරක්ෂිත කලාපයේ යුධ හමුදා භාරයේ පවතින බැවින් දීර්ඝ කාලයක් පැවති යුද්ධය හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) පුත්තලම, පාලවී හා කල්ලඩි ප්‍රදේශවල තිබූ අක්කර 152 ක ඉඩම්, ඵලදායී කාර්යයක යෙදවීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි. මින් අක්කර 09 ක් වූ ඉඩම් කොටසක අනවසර පදිංචිකරුවන් විසින් නිවාස ඉදිකර පදිංචි වී තිබුණු අතර අනාරක්ෂිතව හා ප්‍රයෝජනයකින් තොරව මෙම ඉඩම් වල් බිහි වී පැවතීම නිසා අනවසර පදිංචිකරුවන් පදිංචිවීම වැළැක්විය නොහැකි වී තිබුණි.

(ඇ) මන්නාරම් දිස්ත්‍රික්කයේ පුලියාඩු ඉරක්කම්වල (Puliyadi Irakkam) පිහිටි අක්කර 604 කින් යුත් මැටි සහ හුණුගල් නිධිය සහිත අක්කර 1,191 ක ඉඩම් දිගු කාලීන බදු පදනම මත සංස්ථාවට අයිති බවට ලිපිලේඛන අනුව අනාවරනය වි ඇතත් පසු ගිය කාලයේ පැවති යුධ තත්ත්වය හේතුවෙන් ලිපිලේඛන විනාශ වීම නිසා අයිතිය තහවුරු කර ගත නොහැකිවී ඇත.අවතැන් වූ පවුල් සඳහා මෙම ඉඩම් ලබා දීමට කටයුතු කරමින් පවතින බව නිරීක්ෂණය විය.

( ඈ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ගිණුම් මගින් අනාවරණය කර නොතිබුණු ගාල්ලේ පිහිටි අක්කර 06 පර්චස් 11ක් වූ ඉඩම නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5 හඳුනාගන්නා ලද පාඩු**

ආනයනය කරන ලද සිමෙන්ති නියමිත දිනට නිදහස් කර නොගැනීම හේතුවෙන් රු. 145,329 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

( අ) සංස්ථාවේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලය 76 ක් හා තථ්‍ය කාර්යය මණ්ඩලය 57 ක් වුයෙන් පුරප්පාඩු 20ක් හා අතිරික්ත එක් නිලධාරියෙකු ගෙන් සමන්විත විය. මෙම කාර්ය මණ්ඩලයෙන් 33 ක් කන්කසන්තුරේ ශාඛාවේ සේවය කළ අතර එම භූමිය හමුදාව විසින් පවරා ගැනීම නිසා එම සේවකයන් සඳහා ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ක්‍රියාත්මක වෙමින් පවතී.

( ආ) සංස්ථාවේ පැවති විකුණුම් හා අළෙවි නිලධාරී පුරප්පාඩු වු තනතුර සඳහා 2011 නොවැම්බර් 17 දිනැති එම්එස්ඩී 30 දරන චක්‍රලේඛයේ සඳහන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව මූලික සුදුසුකම් නොමැති පුද්ගලයෙක් බඳවා ගෙන ඔහුට වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.485,400 ක් ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා වු ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත ආදායම හා වියදම සමාලෝචනය කර ඒවා සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ඉලක්කගත අළෙවි ආදායම රු.832,000,000 ක් වුවද, තත්‍ය ආදායම රු.285,657,759 ක් වුයෙන් ඉලක්කගත ආදායමෙන් සියයට 34 ක් පමණක් ලහාකර ගෙන තිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් මුළු සංස්ථාවම ආවරණය වන පරිදි 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 වගන්තිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි.

**5.3 නොවිසඳි ඇති විගණන ඡේද**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් අක්කර 5,352 ක් වූ අරුවක්කාළු පිහිටි හුණුගල් නිධියක් 1995 වර්ෂයේදී සිමෙන්ති නිෂ්පාදනය සඳහා හුණුගල් හාරා ගැනීමට හොල්සිම් ලංකා පෞද්ගලික සමාගමට වසර 50 ක කාල සීමාවකට බදු දී තිබුණි. ගිවිසුම අනුව අයකරගත යුතු කුලිය වර්ෂයකට රු.26,516,620 ක් වු අතර ගිවිසුමේ කොන්දේසි අනුව වසර 50 තුළම කුලී සංශෝධනයන් කිරීමේ හැකියාවක් සංස්ථාවට නොමැත. එහෙයින් 2011 අගෝස්තු 16 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේ දී මෙම හුණුගල් නිධිය පිළිබඳ වූ බදු ගිවිසුම නැවත සංශෝධනය කිරීමට උපදෙස් ලබාදී තිබුණු නමුත් 2015 අගෝස්තු 25 දිනය වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාපතිවරයා වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) මූල්‍ය පාලනය
(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ණය
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) ගබඩා පාලනය